# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1645/23 - 2010 මාර්තු 17 වැනි බදාදා - 2010.03.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV (අ) වැනි කොටස - පළාත් සභා

### පළාත් සභා නිවේදන

**බස්නාහිර පළාතේ පළාත් සභාව**

1990 අංක 06 දරන මුදල් ප්‍රඥප්තිය

**5(1) වගන්තිය යටතේ සිදු කරනු ලැබූ නියෝගය අවලංගු කිරීම**

***අංක 1626/8, 2009 නොවැම්බර් 04 වැනි දිනැති අති විශෙෂ ගැසට් පත්‍රයේ පළකළ නිවේදනය සංශෝධනය කිරීම***

බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන, පළාත් පරිපාලන, විදුලිබල හා බලශක්ති, මිනිස්බල හා රැකී රක්ෂා සහ ආර්ථික ප්‍රවර්ධන අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1626/8, 2009 නොවැම්බර් මස 04 වැනි දිනැති *ගැසට් පත්‍රයෙහි* පළකළ නිවේදනයෙහි, " මෙම නියෝගය මගින්" යන වචන ඉවත් කිරීමෙන් එම නිවේදනය පහත පරිදි සංශෝධන කරනු ලබන බව දන්වමි.

" බස්නාහිර පළාතේ පළාත් සභාවේ 1990 අංක 06 දරන මුදල් ප්‍රඥප්තියේ 5 (1) වගන්තියෙන් මා වෙත පැවරී තිබෙන බලතල ප්‍රකාර, බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන, පළාත් පරිපාලන, විදුලිබල හා බලශක්ති, මිනිස්බල හා රැකී රක්ෂා සහ ආර්ථික ප්‍රවර්ධන අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මම 1991 ජුනි මස 10 වැනි දිනැති හා අංක 666/4 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් නියෝග කරන ලද, 1990 නොවැම්බර් 20 දිනැති හා අංක 637/8 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* සඳහන් නිදහස් ව්‍යාපාර ලේඛනයට, 1991 ජුනි මස 15 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් ව්‍යාපාරය ද ඇතුළත් විය යුතු බවට කරන ලද නියෝගය 2009 නොවැම්බර් මස 15 වැනි දින සිට බලපවත්වන පරිදි මෙයින් අවලංගු කරමි."

" තීරු බදු රහිත අලෙවි සැල් "

ප්‍රසන්න රණතුංග,
බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන,
නීතිය හා සාමය, ඉඩම් , අධ්‍යාපන, පළාත් පාලන, පළාත් පරිපාලන,
විදුලිබල හා බලශක්ති, මිනිස්බල හා රැකී රක්ෂා සහ ආර්ථික ප්‍රවර්ධන අමාත්‍ය.

2010 මාර්තු මස 16 වැනි දින,
කොළඹ 07,
ශ්‍රාවස්ති මන්දිරයේ පිහිටි,
බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍යාංශයේ දී ය.

04 - 75

1A - PG 001130 — 830 (2010/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.